රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 05/2008 (I)

මගේ අංකය :AR/CCG /01
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2018.01.24

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

## <u>පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම</u>

රජයේ ආයතන මගින් මහජනයාට ලබා දෙන සේවාවන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායීව ලබා දීමට අවශ්‍ය පසුබිම සැකසීම සඳහා “පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම ” මැයෙන් 2008.02.06 දිනැතිව නිකුත් කළ අංක 05/2008 චක්‍රලේඛය වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. කාලයත් සමඟ වර්ධනය වූ රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධ වන්නාවූ පාර්ශ්වයන් අතර මනා අවබෝධය සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට “පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම ” මැයෙන් නිකුත් කළ චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අවශ්‍ය සංශෝධනයන් සහිතව ක්‍රියාත්මක කිරීම මනා පිටිවහලක් වේ.

03. එබැවින් 05/2008 චක්‍රලේඛය වෙත ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර එම උපදෙස් ඔබගේ ආයතනය තුළ මෙන් ම ඔබ යටතේ පාලනය වන අනෙකුත් ආයතන තුළ ද වඩාත් අර්ථවත් ලෙස ක්‍රියාත්මක කරන මෙන් මෙයින් කාරුණිකව දන්වමි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි කාර්ය සාධනය පිළිබඳ සිදු කෙරෙන ඇගයීම්වලදී මෙම අවශ්‍යතාව අවධාරණය කර තිබේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරියේදී සිදු කරන රාජ්‍ය ආයතන ඇගයීම් සඳහා යොදා ගන්නා නිර්ණායක පුළුල් කිරීමේදී ද රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම කෙරෙහි පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු වනු ඇත.

**ජේ.ජේ.රත්නසිරි**
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත් -

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති